011-2136690
011-2136630

011-2136602

011-2476169
011-2476181

info@psc.gov.lk

www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION
අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/3/1/36/1/1/2013

ඔබේ අංකය / உமது இல. / Your No.: 1/5/1/7/..../MN-Vol I

දිනය / திகதி / Date: 2022.01. 11

ලේකම්,
ධීවර අමාත්‍යාංශය.

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය (MN-03) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2021.10.21 දිනැති ලිපිය හා බැඳේ.

02. යොමුගත ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උක්ත බඳවාගැනීමේ පටිපාටිය සම්බන්ධව පහත සඳහන් තීරණ ලබා දී ඇති බව, එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

(i). 2013.12.10 දිනැතිව මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා (MN - 03) වන බඳවාගැනීමේ පටිපාටියට, ඇමුණුම 01 හි (පිටු 07කින් සමන්විත) සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.12.30 දින අනුමැතිය ලබා දී ඇති බව,

(ii). උක්ත බඳවාගැනීමේ පටිපාටියේ උපරිම වයස් සීමාව අවුරුදු 30 සිට 40 දක්වා දීර්ඝ නොකිරීමට,

(iii). මෙම බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් තනතුරු සඳහා සන්නද්ධ සේවාවකින් විශ්‍රාම ගත් නිලධාරීන් බඳවාගැනීමට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අපේක්ෂා කරනු ලබන්නේ නම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි සේවා මුක්ත භටයන්ට ලබාදෙන අනුග්‍රහ යටතේ ඔවුන් බඳවාගැනීමට කටයුතු කළහැකි බව.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

<u>පිටපත්</u>

1) ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
2) අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
3) ආයතන අධ්‍යක්ෂ ජනරාල්

} - කරු. දැ.ගැ.ස.

සංශෝධන ලැයිස්තුව

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය MN-03 සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

03 වන සංශෝධනය

| අනු අංකය | ඡේද අංකය | සංශෝධනය වියයුතු ආකාරය |
|---|---|---|
| 1 | 1.3 | යොමු අංකය: DMS/C/3/36/01<br>දිනය: 2010.11.08<br>යොමු අංකය: DMS/C3/36/1<br>දිනය: 2011.05.06<br>යොමු අංකය: DMS/G3/36/1<br>දිනය: 2012.04.30<br>යොමු අංකය: DMS/G3/36/1<br>දිනය: 2012.06.20<br>යොමු අංකය: DMS/G3/36/1-Vol 1<br>දිනය: 2013.04.11<br>යොමු අංකය: DMS/1141/Vol-III<br>දිනය: 2016.07.18<br>යොමු අංකය: DMS/1141/Vol-III<br>දිනය: 2017.11.10<br>යොමු අංකය: DMS/1141/Vol-III<br>දිනය: 2018.04.11<br>යොමු අංකය: DMS/1619-V<br>දිනය: 2020.07.27<br>යොමු අංකය: DMS/1141/Vol IV<br>දිනය: 2021.06.18 |
| 2 | 6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් | (see table below) |

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | ඒවාට පැවරෙන කාර්යයන් |
|---|---|---|
| Marine Engineering Assistant<br><br>(නාවික ඉංජිනේරු සහකාර - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) | 20 | I. අනුමත යාත්‍රාංගනවල නිෂ්පාදිත හා නිෂ්පාදනය වෙමින් පවතින ධීවර යාත්‍රා සඳහා පරීක්ෂණ වාර්තා, තක්සේරු වාර්තා හා මුහුදු යෝග්‍යතා සහතික ලබා දීම.<br>II. නිවෙස්වල ඉදි කෙරෙන පාරම්පරික ධීවර යාත්‍රා සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ද ඉහත සඳහන් සහතික ලබා දිම.<br>III. එසේම, යාත්‍රා ලියාපදිංචිය හා රක්ෂණය කිරිම සඳහා ද අදාළ තාක්ෂණ වාර්තා, මුහුදු යෝග්‍යතා සහතික ලබා දිම හා ධීවර යාත්‍රාවල උපාංග සඳහා තක්සේරු වාර්තා, පරික්ෂණ වාර්තා ලබා දීම හා අදාළ තාක්ෂණික කටයුතු.<br>IV. අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (කර්මාන්ත) හා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් රාජකාරි.<br>V. යාත්‍රාංගන හා එන්ජින් ආදි යාත්‍රා උපාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම වෙනුවෙන් තාක්ෂණික නිරික්ෂණ හා නිර්දේශ ලබා දිම.<br>VI. යාත්‍රාංගන හා උපාංග සැපයුම්කරුවන් මගින් ලබා දිමට නියමිත යාත්‍රා සැළසුම් හා උපාංගවල පිරිවිතර ආදිය සඳහා නිර්දේශ ලබා දිම.<br>VII. දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳව කාර්මික හා යාන්ත්‍රික තත්ත්ව පරික්ෂණ වාර්තා ලබා දිම හා වාහන අලුත්වැඩියාවෙන් පසු නැවත පරික්ෂා කර ගෙවීම් නිර්දේශ ලබා දිම. |
| | | Draughtsman<br><br>(සැලසුම් ශිල්පි - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) | 01 | I. ගොඩනැගිලි ඉදිරි කිරිම, නවීකරණය හා අලුත්වැඩියා කටයුතුවලට අදාළ ගිණුම් හා දල සැළසුම් අනුව සැළසුම් පිළියෙළ කිරිම.<br>II. දෙපාර්තමේන්තුවට අවශ්‍ය මේස, පුටු, රාක්ක ආදිය සඳහා ඇණවුම් කිරිමට මිළ ගණන් කැඳවීමට අවශ්‍ය සැළසුම් පිළියෙළ කිරිම.<br>III. ගොඩනැගිලි ඉදි කිරිම, නවීකරණය හා අලුත්වැඩියා කටයුතු සඳහා වූ බිල්පත් හා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඇස්තමේන්තුවල ගණනයන් පරීක්ෂා කිරීම.<br>IV. අධ්‍යක්ෂ ජනරාල් හා සිවිල් ඉංජිනේරු විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| | | Technical Officer – Civil<br><br>(තාක්ෂණ නිලධාරි - සිවිල්) | 02 | I. ගොඩනැගිලි ඉදි කිරීම. නවීකරණය හා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම.<br>II. මැනීම හා මට්ටම් ගැසීම.<br>III. ප්‍රමාණ සමීක්ෂණය. ගොඩනැගිලි නිර්මාණය හා පවිත්‍රතා කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.<br>IV. අධ්‍යක්ෂ ජනරාල් හා සිවිල් ඉංජිනේරු විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| | | Technical Officer – Computer<br><br>(තාක්ෂණ නිලධාරි - පරිගණක) | 01 | I. යාත්‍රා නිරීක්ෂණ පද්ධතියට අදාළ ජීව පරිපථවල නිසි නඩත්තු කටයුතු කිරීම.<br>II. යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ දෝෂ පවතින්නේ ද යන්න පරීක්ෂා කර බලා වාර්තා කිරීම.<br>III. ගුවන් විදුලි පණිවිඩ හුවමාරු ඇන්ටෙනා පද්ධතිය හා අනෙකුත් ගුවන්විදුලි පණිවිඩ සම්ප්‍රේශණ උපාංග මනා තත්ත්වයෙන් පවත්වා ගැනීමට අවශ්‍ය නඩත්තු සිදු කිරීම.<br>IV. සියලු ගුවන්විදුලි පණිවිඩ හුවමාරු යන්ත්‍ර මනා තත්ත්වයෙන් පවත්වා ගැනීම.<br>V. රවුටර් හා අන්තර්ජාල ස්විචයන් මනා තත්ත්වයෙන් නඩත්තු කිරීම.<br>VI. අංශයට අදාළ පරිගණක උපාංග හා අනෙකුත් උපාංගයන් මනා තත්ත්වයෙන් පවත්වා ගැනීම හා අවශ්‍ය වන පරිදි අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | VII. සහකාර අධ්‍යක්ෂ හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන රාජකාරි ඉටුකිරීම. |
| | | Operational Officer<br><br>(මෙහෙයුම් නිලධාරී) | 02 | I. ධීවර යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය විධිමත්ව පවත්වා ගෙන යාම.<br>II. ධීවර යාත්‍රා ගමන් කරනු ලබන මුහුදු තීර හා දිශාවන් යනාදිය මොනිටරය මගින් නිරීක්ෂණය කිරීම.<br>III. අවශ්‍ය වූ විටෙකදී ගුවන්විදුලි සම්ප්‍රේශණ මගින් හෝ ඊ මේල් භාවිතයෙන් යාත්‍රා සමග සම්බන්ධතාවය පවත්වා ගෙන යාම.<br>IV. ධීවර යාත්‍රාවලට සිදු වන ආපදාමය තත්ත්වයන් නිරීක්ෂණ කිරීම හා එවැනි අවස්ථාවල දී එම යාත්‍රාව සමග ඉහත III හි ආකාරයට සම්බන්ධ වීම හා එම යාත්‍රා බේරා ගැනීම සඳහා අවශ්‍ය සියලු ඉදිරි කටයුතු කිරීම.<br>V. කිසියම් යාත්‍රාවක් මුහුදු සීමාවල් උල්ලංඝණය කරන්නේ නම් ඒ බව එම යාත්‍රාවලට ඉහත III හි ආකාරයට සම්බන්ධ වී දැනුම් දීම හා ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අංශ භාර ප්‍රධානියාට දැනුම් දීම.<br>VI. නිරීක්ෂණ පද්ධතියේ දෝෂයක් ඇති වූ විටෙක දී එය යථා තත්ත්වයට පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා අංශ භාර ප්‍රධානියා දැනුම් දීම.<br>VII. සහකාර අධ්‍යක්ෂ හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන රාජකාරි ඉටු කිරීම. |

| | | |
|---|---|---|
| 3 | 6.2<br>ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව | පහත පරිදි සංශෝධනය කිරීමට:<br>නාවික ඉංජිනේරු සහකාර 20<br>සැලසුම් ශිල්පි 01<br>තාක්ෂණ නිලධාරි (පරිගණක) 01<br>තාක්ෂණ නිලධාරි (සිවිල්) 02<br>මෙහෙයුම් නිලධාරි 02<br><br>ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ. |

| | | |
|---|---|---|
| 4 | 7.2.2.2<br>වෘත්තීය සුදුසුකම් | **1.** නාවික ඉංජිනේරු සහකාර<br>i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු/ නාවික ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව<br>හෝ<br>ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව<br>හෝ<br>iii. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ ඩිප්ලෝමාව<br>හෝ<br>iv. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය විසින් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු උසස් තාක්ෂණ ඩිප්ලෝමාව<br>හෝ<br>v. ශ්‍රී ලංකා නාවික හමුදා නාවික ශිල්ප පුහුණු ආයතනය විසින් පිරිනමනු ලබන නාවික ඉංජිනේරු ඩිප්ලෝමාව |

2. සැලසුම් ශිල්පි

i. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතා සහ - NVQ 5 ජාතික මට්ටමට අඩු නොවන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම.

3. තාක්ෂණ නිලධාරි (පරිගණක)

i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන පරිගණක තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක විද්‍යා ඩිප්ලෝමාව

හෝ

iii. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන පරිගණක තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

iv. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය විසින් පිරිනමනු ලබන පරිගණක උසස් තාක්ෂණ ඩිප්ලෝමාව

4. තාක්ෂණ නිලධාරි (සිවිල්)

i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව

හෝ

iii. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

iv. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

5. මෙහෙයුම් නිලධාරි

i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන විදුලි සංදේශ ආශ්‍රිත තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන විදුලි සංදේශ ආශ්‍රිත තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

iii. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන විදුලි සංදේශ ආශ්‍රිත තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

iv. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය විසින් පිරිනමනු ලබන විදුලි සංදේශ ආශ්‍රිත උසස් තාක්ෂණ ඩිප්ලෝමාව

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2016

මගේ අංකය: PSC/EST/3/3/3/II/තාවකාලික

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05.

2016 මාර්තු මස 03 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථා සකස් කිරීම සම්බන්ධ උපදෙස් මාලාවේ 7.2.5 වගන්තිය සංශෝධනය කිරීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව, රාජ්‍ය සේවයේ සියලුම බඳවා ගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථා සකස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත උපදෙස් මාලාවේ විවෘත බඳවා ගැනීමේ අයදුම්පත් කැඳවීමේ ක්‍රමය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්.

තවද, දැනට අනුමත කර ඇති සියලුම සේවා ව්‍යවස්ථා සහ බඳවා ගැනීම් පරිපාටිවල විවෘත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ ක්‍රමය මේ අනුව සංශෝධනය කර ගන්නා ලෙස දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව